*"Skills Development For a Better Future"*

# ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය
# இலங்கை தேசிய தொழில்நுட்பக்கல்வி நிறுவகம்
# National Institute of Technical Education of Sri Lanka

NITE SRI LANKA

100, කඳවල පාර, රත්මලාන இல. 100, கந்தவல வீதி, இரத்மலானை. No. 100, Kandawala Road, Ratmalana.

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය தொழில்நுட்பக்கல்வி தொழிற்பயிற்சி அமைச்சு Ministry of Technical Education and Vocational Training

2002.03.25

අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
කොළඹ - 10

## <u>සංවර්ධනය කරන ලද ජා.තා.ස. - යාන්ත්‍රික, විදුලි, සිවිල්, පරිමාණ මිනුම් යන සියලු පාඨමාලා සඳහා පොදු ඇගයීම් පිළිවෙල</u>

01. පාඨමාලාවේ වසර තුනටම අදාළ සියලු විෂයයන් අනිවාර්ය වන අතර පාඨමාලාව සමත්ව අවසාන සහතිකය ලැබීම සඳහා එම සියලු විෂයයන්ගෙන් සාමාර්ථය ලැබිය යුතුය.

02. පළමු හා දෙවන වසර මුල් පරීක්ෂණවලදී එම වසර සමත්වීම සඳහා වසරට අදාළ සියලු විෂයයන්ගෙන් සමත් විය යුතුය.

03. පළමු හෝ දෙවන වසර මුල් පරීක්ෂණයේදී අවම වශයෙන් විෂයයන් 4 ක් එක්වර සමත්වීම ඌණ සාමාර්ථයක් ලැබීමක් ලෙස සැලකේ.

04. මුල් පරීක්ෂණයේදී අසමත්වන විෂයයන් නැවත පරීක්ෂණයේදී සමත්විය යුතුය. නැවත පරීක්ෂණය, පළමු වාරය ආරම්භ කර මාසයක් තුළ පැවැත්විය යුතුය.

05. නැවත පරීක්ෂණයේදී ද සමත්වීමට නොහැකි වන විෂයයන් පාඨමාලාවේ අවසාන පරීක්ෂණයට පෙර සමත්විය යුතුය.

06. යම් වසරක මුල් පරීක්ෂණයේදී එක්වර විෂයයන් 4 කට වඩා අඩුවෙන් සමත්වන සිසුන් එම වසර අසමත් වුවන් ලෙස සලකනු ලැබේ. එහෙත් ඔවුනට ඊළඟ වසර පංතියෙහි ඉගැනීමට අවස්ථාව දිය හැක.

07. එම සිසුන් නැවත පරීක්ෂණයේදී සියලු විෂයයන් සඳහා පෙනී සිටිය යුතු වේ.

08. නැවත පරීක්ෂණයේදී ද එක්වර විෂයයන් 4 කට වඩා අඩුවෙන් සමත්වන සිසුන් එම වසර අසමත් වුවා සේ සලකනු ලැබේ. ඒ අනුව ඔවුනට එම වසරේ පංතියට නැවත යාමට සිදු වේ.

09. නැවත පරීක්ෂණයේදී විෂයයන් 4 කට වඩා සමත්වන සිසුන් අසමත්වන විෂයයන් පාඨමාලාවේ අවසන් පරීක්ෂණයට පෙර සමත්විය යුතුය.

10. නැවත පරීක්ෂණයකදී සමත්වන විෂයයන් සඳහා උපරිම වශයෙන් ප්‍රදානය කරනු ලබන්නේ ප්‍රශ්ණ පත්‍රයට අදාළ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක ලකුණු ප්‍රමාණයකි.

11. පිළිගත හැකි සාධාරණ කරුණක් හේතුවෙන් යම් සිසුවෙකුට මුල් පරීක්ෂණයේදී යම් විෂයයන්ට හෝ විෂයයන් සියල්ලටම පෙනී සිටිය නොහැකි වුවහොත්, එවැනි අවස්ථාවකදී නැවත පරීක්ෂණය ඔහුගේ මුල් පරීක්ෂණය ලෙස සලකනු ලැබේ. එහෙත් නැවත පරීක්ෂණයකට පෙනී සිටීමේ අවස්ථාවක් ඔහුට ලැබෙන්නේ නැත.

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | பணிப்பாளர் நாயகம் | Director General | Tel: 605677 | Fax: 622461 |
| අධ්‍යක්ෂ (විෂය මාලා) | பணிப்பாளர் | Director (C D U) | Tel: 622457 | |
| අධ්‍යක්ෂ (මානව සම්පත්) | பணிப்பாளர | Director (H R D) | Tel: 636796 | E-Mail:nite@sllt.lk |
| කාර්යාලය | அலுவலகம் | Office | Tel: 624405 | http://www.nitesl.slt.lk |

12. තුන්වන වසර හෙවත් පාඨමාලා අවසාන පරීක්ෂණයේදී ද එම වසරට අදාළ සියලු විෂයයන්ගෙන් සමත්විය යුතු වේ.

13. පරීක්ෂණයේදී අවම වශයෙන් විෂයයන් 4 ක් සමත් වු සිසුන් ඌණ සාමාර්ථය ලැබුවන් ලෙස සලකනු ලැබේ.

14. ඉතිරි විෂයයන් ඉදිරි වසර දෙක තුළදී සම්පූර්ණයෙන් සමත් විය යුතුය.

15. එසේ වසර තුනක් තුළ තුන්වන වසරට අදාළ සියලු විෂයයන් සමත්වීමට අපොහොසත් වන සිසුන් තුන්වන වසර අසමත් වු ලෙස සලකනු ලැබේ. එවැනි සිසුන් ඊළඟ වසරේදී සියලු විෂයයන් සඳහා පරීක්ෂණයට පෙනී සිටිය යුතු වේ.

16. පරීක්ෂණවලදී විෂයයන් සඳහා ශ්‍රේණි පිරිනැමීමට අදාළ ලකුණු පරාසයන් :

| | | | | |
|---|---|---|---|---|
| 0 | - | 34 | අසමත් | (F) |
| 35 | - | 54 | සමත් | (S) |
| 55 | - | 74 | සම්මාන සාමාර්ථ | (C) |
| 75 | - | 100 | විශිෂ්ට සාමාර්ථ | (D) |

- පාඨමාලාවේ පළමු වසර හා දෙවන වසර ඇගයීම්, කලාප මට්ටමින් ද, පාඨමාලා අවසාන පරීක්ෂණය දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් ද සිදු කළ යුතු යයි යෝජනා කරමු.

අධ්‍යක්ෂ (විෂයමාලා) වෙනුවට
නියෝජ්‍ය අධ්‍යක්ෂ (විෂයමාලා)